# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2362/23 - 2023 දෙසැම්බර් මස 12 වැනි අඟහරුවාදා - 2023.12.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 117(2)(ඣ) වගන්තිය යටතේ පවරා ඇති බලතල අනුව සිවිල් ගුවන්සේවා විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි.

**නිමල් සිරිපාල ද සිල්වා (පා.ම),**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

රෙගුලාසි

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 117(2)(ඣ) වගන්තියට අනුව, සිවිල් ගුවන්සේවා විෂය භාර අමාත්‍යවරයා විසින්, කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය (Colombo Flight Information Region) හරහා පියාසර කරන ගුවන්යානා වෙත ශ්‍රී ලංකාව විසින් සපයනු ලබන ගගන නාවික පහසුකම් සහ සේවාවන් භාවිතා කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු පිළිබඳව පහත සඳහන් රෙගුලාසි සාදනු ලැබ ඇත.

1. මෙම රෙගුලාසි 2023 අංක 02 දරන ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු (Enroute Navigation Facility Charges) රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලැබේ. රෙගුලාසි උපුටා දැක්වීම සහ බලාත්මක දිනය

2. මෙම රෙගුලාසිවලට අනුකූලව ගෙවිය යුතු ගාස්තු, කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපයට ඉහළින් නොනවත්වා පියාසර කරන ගුවන්යානා සඳහා ශ්‍රී ලංකාව විසින් සපයනු ලබන ගගන නාවික පහසුකම් සහ සේවාවන් ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද පිරිවැය අයකර ගැනීම අරමුණු කර ගෙන ඇත. එම පහසුකම් සහ සේවා අතරට ගගන නාවික සේවා සැපයීම සඳහා පත් කරන ලද ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් නඩත්තු කරන ලද, මෙහෙයවන ලද හෝ සංවිධානය කරන ලද හෝ, ගුවන් මාර්ග සහ ගුවන්පථ පහසුකම් සැපයීම, කාලගුණ සේවා, ගුවන් ගමනාගමන පාලන සේවා, නිරුපද්‍රිත නියාමන සේවා සහ සෙවුම් සහ ගලවා ගැනීමේ සේවා සැපයීම් සහ එවැනි සේවාවන්, අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා, අධිකාරිය විසින් ඉටුකරනු ලබන නිරුපද්‍රිතා අධීක්ෂණ කටයුතු ඇතුළත් වේ. අරමුණු


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අදාළත්වය

3. මෙම රෙගුලාසිවලින් නිදහස් නොවන්නේ නම් මිස, ශ්‍රී ලංකාවේ කිසිදු ගුවන්තොටුපලකට ගොඩනොබවස්වා, කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය හරහා නොනවත්වා පියාසර කරන සෑම ගුවන්යානයක්ම, ගුවන් ගමන් පහසුකම් සහ සේවා සැපයීම සහ නිරුපද්‍රිත නියාමන සේවා වෙනුවෙන්, මෙහි උපලේඛනයට අනුව ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තුවක් ගෙවිය යුතුය.

ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු ගණනය කිරීමේ පදනම

4. මෙහි උපලේඛනයේ දක්වා ඇති නිර්ණායකයන්ට යටත්ව, ගුවන්යානයක ගුවන්ගත විය හැකි උපරිම බර සහ කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපයේ ගුවන්යානය පියාසර කරන දුර සංයෝජනය මත පදනම්ව, ගුවන්යානය සඳහා ගෙවිය යුතු ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු ගණනය කළ යුතුය.

ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු ගෙවීමේ යාන්ත්‍රණය

5. (අ). ගුවන්යානා මෙහෙයුම්කරු සහ අධ්‍යක්ෂ ජනරාල් අතර වෙනත් ආකාරයකින් එකඟ වී ඇත්නම් මිස, කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපයට ඉහළින් නොනවත්වා පියාසර කරන සෑම ගුවන්යානයක්ම, පනතේ 31 වගන්තිය (ඉ), (ඊ), (උ), සහ (ඌ) යටතේ දක්වා ඇති ගගන නාවික සේවා සැපයීම සඳහා පත් කර ඇති ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු වෙත අදාළ ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තුව එක්සත් ජනපද ඩොලර් වලින්, ඉන්වොයිසිය නිකුත් කළ දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.

(ආ). මෙම රෙගුලාසි යටතේ ගෙවිය යුතු ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තුවක් පැහැර හරිනු ලැබුවහොත්, ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු වෙත, ප්‍රමාද වී ගෙවීම සඳහා වන 2% මාසික පොළිය සමඟ, ලැබිය යුතු මුදලක් ලෙස සලකා අයකර ගත හැකිය.

ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තුවලින් නිදහස් කිරීම

6. මෙම රෙගුලාසි යටතේ නියම කරනු ලැබ ඇති ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තුවක් පහත සඳහන් ගුවන්යානා සම්බන්ධයෙන් ගෙවිය යුතු නොවේ:

(අ) යාන්ත්‍රික දෝෂ හෝ කාලගුණ තත්වයන් හෝ ගුවන් ගමන්වල ආරක්ෂාවට බලපාන වෙනත් හේතුන් මත හෝ අනපේක්ෂිතව කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපයට ඇතුලුවන ගුවන්යානා;
(ආ) මානුෂීය සහන සඳහා ක්‍රියාත්මක වන ගුවන්යානා;
(ඇ) රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමනක් ලෙස නම් කර ඇති ගුවන්යානා ; හෝ
(ඈ) හේතු දක්වා, අධ්‍යක්ෂ ජනරාල් විසින් වෙනත් ආකාරයකින් නිදහස් කළ ගුවන්යානා.

ආදායම් එකතු කිරීම, වාර්තා තබා ගැනීම සහ ගිණුම්කරණය

7. (අ) ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින්, මෙම රෙගුලාසි යටතේ අයවිය යුතු සියලුම ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු එකතු කරනු ලැබිය යුතු අතර පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිසි වාර්තා පවත්වා ගත යුතුය:

1. ගුවන්යානා ක්‍රියාකරුගේ නම සහ ව්‍යාපාරික ලිපිනය;
2. ගුවන්යානයේ වර්ගය සහ එහි ගුවන්ගතවිය හැකි උපරිම බර (MTOW) ;
3. කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපයෙන් ගුවන් ගමන් කළ දිනය සහ ඇතුල්වීමේ වේලාව සහ ස්ථානය සහ පිටවීමේ වේලාව සහ ස්ථානය;
4. ගුවන් ගමන් සැලැස්මට අනුව මාර්ගය සහ දුර:
5. පියාසර කිරීමේ අරමුණ;
6. අයකරනු ලැබූ ගාස්තු ප්‍රමාණය; සහ
7. වෙනත් අදාළ තොරතුරු

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් සියලුම තොරතුරු පිළිබඳ මාසික වාර්තා, ව්‍යවස්ථාපිත සේවා සපයන්නා විසින් සිවිල් ගුවන්සේවා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් සහ අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු අයකිරීම මගින් එකතු කරන ලද ආදායමෙන් සියයට හතළිහක් (40%) ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් සෑම දෙසතියකට වරක් මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය.

අර්ථ දැක්වීම්

8. "ගුවන් සංතරණ සේවා" යනු කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපයේ ගුවන් සීමාව තුළ ගුවන් යානා නිරුපද්‍රිතව, ආරක්ෂිතව, කාර්යක්ෂමව, ක්‍රමවත්ව, ආර්ථික වශයෙන් තිරසාර හා පාරිසරික වශයෙන් ප්‍රතිචාර දක්වන ගුවන්යානා මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකාව විසින් සපයනු ලබන පහත සඳහන් පහසුකම් හෝ සේවාවන් ය:

(අ) ගුවන් මාර්ග සහ ගුවන්පථ ඔස්සේ දෘශ්‍ය හා දෘශ්‍ය නොවන ආධාර;
(ආ) සන්නිවේදන සේවා ;
(ඇ) ගුවන් සංතරණ කාලගුණ සේවා ;
(ඈ) ගුවන් ගමනාගමන පාලන සේවා සහ පහසුකම්;
(ඉ) අනතුරු ඇඟවීමේ සේවා;
(ඊ) උපදේශන සේවා;
(උ) පියාසැරි තොරතුරු සේවය ;
(ඌ) සෙවීම් සහ ගලවා ගැනීමේ සේවා ; සහ
(ඹ) අධිකාරිය විසින් ඉටුකරනු ලබන නිරූපද්‍රිත සහ ආරක්ෂක අධීක්ෂණ කටයුතු

"අධිකාරිය" යනු 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරි පනත යටතේ පිහිටුවන ලද අධිකාරියයි.

"කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය" යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාවේ ගුවන් කලාපය සහ යාබද සාගර ගුවන් අවකාශය තුළ ගුවන් සංතරණ සේවා සැපයීම සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් ආසියාව සහ පැසිෆික් කලාපවල ගුවන් සංතරණ කලාපීය සැලැස්ම යටතේ ශ්‍රී ලංකාවට පවරා ඇති, ගුවන් අවකාශයයි.

"අධ්‍යක්ෂ ජනරාල්" යනු 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරි පනත යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

"ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු" යනු 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 6(3) අ වගන්තිය යටතේ පත් කරන ලද ව්‍යවස්ථාපිත සේවා සපයන්නාය.

9. මෙම රෙගුලාසි බලාත්මක වීමත් සමඟ, 1981 ජුලි 3 දිනැති රජයේ *ගැසට්* අංක 147/12 හි ප්‍රකාශයට පත් කරන ලද 1981 අන්තර් ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු රෙගුලාසි සහ 2023 පෙබරවාරි මස 16 වන දිනැති රජයේ *ගැසට්* අංක 2319/64 හි ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු රෙගුලාසි, ඒ යටතේ පූර්වයෙන් සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ. එසේ ම 2003 අප්‍රේල් 04 දිනැති රජයේ ගැසට් අංක 1282/29 හි 04 වන රෙගුලාසිය ද සංශෝධනය වේ.

ඉවත්කිරීමේ විධිවිධාන

10. ඉහත 09 වන ඡේදයේ සඳහන් අවලංගු කරන ලද රෙගුලාසි යටතේ අයවිය යුතු ගාස්තු සහ මෙම රෙගුලාසි ක්‍රියාත්මක වන දිනට නොගෙවා ඉතිරිව ඇති ගාස්තු ගෙවිය යුතු වන අතර එය රජයට ලැබිය යුතු මුදලක් සේ සලකා අය කර ගත යුතුය.

ඉතිරිකිරීම් සහ සංක්‍රාන්ති විධිවිධාන

## උපලේඛනය

### *ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු ගණනය කිරීම*

(අ) ගුවන්යානයක ගුවන්ගත විය හැකි උපරිම බර (MTOW), ගුවන් යානයේ ගුවන් යෝග්‍යතා සහතිකයේ සඳහන් ගුවන්ගත විය හැකි උපරිම බර විය යුතු අතර එසේ නොමැති විට, එය අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබිය හැකි අතර එය මෙට්‍රික් ටොන් වලින් "බර සාධකය" ලෙස, ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලැබිය යුතුය.

(ආ) පියාසර කරන දුර යනු ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු වෙත ගොනු කරන ලද ගුවන් ගමන් සැලැස්මේ, ගුවන්යානා මෙහෙයුම්කරු විසින් ප්‍රකාශයට පත් කරන ලද, කොළඹ පියාසර තොරතුරු කලාපයේ (FIR) පියාසර කරන දුර ප්‍රමාණය විය යුතු අතර එය නාවික සැතපුම් වලින් "ගාස්තු ගෙවිය යුතු දුර" ලෙස ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලැබිය යුතුය.

(ඇ) මෙම උපලේඛනයේ (ඈ) සහ (ඉ) ඡේදයට යටත්ව ගුවන් යානයක් සඳහා ගෙවිය යුතු මුළු ගුවන් ගමන් සංතරණ පහසුකම් ගාස්තු ගණනය කිරීම පහත සූත්‍රය පරිදි ගණනය කළ යුතුය:

$$\text{ගුවන්ගමන් සංතරණ පහසුකම් ගාස්තුව (ඇ.එ.ජ.ඩො.)} = \frac{\text{ගාස්තු ගෙවිය යුතු දුර} + \text{උපරිම ගුවන්ගත වීමේ බර}}{3}$$

මෙහි;

1. ගාස්තු ගෙවිය යුතු දුර යනු ගුවන්යානා මෙහෙයුම්කරු විසින් ගොනු කරන ලද ගුවන් ගමන් සැලැස්මට අනුව නාවික සැතපුම් වලින් කොළඹ පියාසර තොරතුරු කලාපයේ (FIR) පියාසර කරන දුර ප්‍රමාණයයි.

2. ගුවන්ගත වීමේ බර යනු ගුවන් යානයේ ගුවන් යෝග්‍යතා සහතිකයේ දක්වා ඇති පරිදි හෝ එසේ නොමැති විට අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන පරිදි මෙට්‍රික් ටොන් වලින් (හෝ MTOW) ගුවන්ගත විය හැකි උපරිම බර ප්‍රමාණයයි.

(ඈ) කොළඹ පියාසර තොරතුරු කලාපය තුළ නාවික සැතපුම් 600 කට වඩා පියාසර කරන ගුවන්යානා සඳහා, "ගාස්තු ගෙවිය යුතු දුර" නාවික සැතපුම් 600 ක උපරිමයකට සීමාවිය යුතුය.

(ඉ) කොළඹ පියාසර තොරතුරු කලාපය තුළ නාවික සැතපුම් 300 කට වඩා අඩුවෙන් පියාසර කරන ගුවන්යානා සඳහා, "ගාස්තු ගෙවිය යුතු දුර" නාවික සැතපුම් 300 ක අවමයකට යටත්විය යුතුය.

EOG 12 - 0164

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.